ජගත් ජේ එදිරිසිංහ

# කටු 5

මදාරා තෙවන වතාවට තිසර සූරිය බණ්ඩාරගේ නවාතැනේ පඩිපෙළ නගිමින් සිටියේ ගව් ගණනක් උස කන්දක් නගින්නා සේ අපහසුවෙනි. පුංචි සන්දියේ සිරිපාදේ නගිද්දී කකුල් රිදෙන්නේ යයි කංකෙඳිරි ගෑ විට අප්පච්චි තමා කර මත හිඳුවාගෙන කන්ද නැගි සැටි මදාරාට තවමත් මතකය. අද තමා තනිවම මේ මහගිරි දඹ නගිනු අප්පච්චි කොතැනක හෝ සිට බලා සිටිනු ඇතැයි ඇයට සිතුණි. ඒ සමගම චංචල වූ සිත ඇය පඩි පෙළ මත අතරමග නවත්වන්නට සමත් විය.

ගරාදි වැටේ ඔප දැමූ ලීය දෑතින්ම අල්ලාගත් වනම මදාරා නැවතී බලා සිටියා ය. පියගැට දහස් ගණනක් නගින්නට ඇති කන්ද අතරමග නැවතී සිටින්නාක් මෙන් හැඟීමක් ඇයට දැනුණි. සුළඟ දරා සිටිය නොහැකිව කෙඳිරි ගානා විලෝ ගස් අතරින් අව් රැළි පඩිපෙළ මතට වැටුණි. ඇයට වෙහෙසක් දැනුණි. දැඩි වෙහෙසක් දැනුණි. එනමුදු නැවතිය නොහැකි ය. මේ කන්ද ඉක්මණින්ම නැග හමාර කළ යුතු ය.

සිත දැඩි කරගත් මදාරා අඩියට දෙක ඉතිරි පඩි කීපය නැග්ගා ය. තිසර සූරිය බණ්ඩාරගේ නවාතැනේ කැඩපතක් මෙන් දිළිසෙන කළුපැහැ ඉදිරි දොර ඇගේ මග හරස් කරමින් රකුසකු සේ ඇය ඉදිරියේ බලා සිටියේ ය. ඇය විදුලි සීනුවට අත තබන්නට සැරසෙත් ම දොර විවෘත විය.



"එන්න.." දොරේ මුවාවේ සිට සූරියබණ්ඩාර කීවේ ය. ඔහු කවුළුව මුවාවේ සිට ඇය එන තෙක් බලා සිටින්නට ඇත. මදාරා සිහිනයෙන් ඇවිදින්නාක් මෙන් සාලයට ඇතුල් වූවා ය. තමාට පිටුපසින් දොර වැසෙන හඬ ඇයට ඇසුණි. ඉන් අනතුරුව සූරිය බණ්ඩාර ගේ අත තම උරහිස මත තැබෙනු ඇයට දැනුණි. ඈ ආපසු හැරී ඔහුට මුහුණ ලා සිට ගත්තා ය. ඔහු මහත් වූ ලෝබකමකින් ඇය වැළඳගන්නට සැරසුණේ ය. ඒ අප්‍රසන්න ස්පර්ශයෙන් මිදෙන්නට ඈ උත්සාහ කළා ය.

"මට මහන්සියි සර්.. මට ආපහු යන්න ඕනෙ.." මදාරා සිහින් හඬින් කීවා ය.

"ඇයි..?" ඔහු ඇසුවේ ය.

"මට යන්න ඕනෙ.." ඈ කීවා ය. ඔහු පුදුමයන් මෙන් තත්පර කීපයක් ඇය දෙස බලා සිටියේ ය.

"පුරුදුවෙන්න ආව වගේනෙ.." ඔහුගේ හඬෙයි රැඳී තිබුණේ නොරුස්නා ස්වරයකි. "..ඔයාට මහන්සි ඇති ...වාඩිවෙන්න.. මං බොන්න මොනා හරි ගේන්නම්.." ඔහු අනතුරුව කීවේ ය. දිග සැප පුටුවේ ගොඩ ගසා තිබූ පුවත්පත් සඟරා ඈත් මෑත් කළ සූරියබණ්ඩාර මදාරාට වාඩි වන්නට ඉඩක් සකස් කළේ ය.

"එපා සර්... මං යන්න ඕනෙ.." මදාරා අදිමදි කළා ය.

සූරිය බණ්ඩාර ශීතකරණය විවෘත කළේ මදාරා කියූ දේ නෑසුණා ලෙසින් ය. ඔහු වීදුරුවකට යමක් වත්කරනු මදාරා අසා සිටියා ය.

"බොන්න.. මහන්සිය ඇරිල යයි.." ඔහු කීවේ ය.

පෙරැත්තයකින් තොරව වීදුරුව අතට ගත් මදාරා වීදුරුවේ තිබූ දොඩම් රසැති පානය එක හුස්මට බීවා ය. ඒ දොඩම් රසය මුවාවේ වෙනත් රසයක් ද තිබුණි ද? මේ දැනෙන ක්ෂණික සුව සිතිවිල්ල කෙසේ ජනිත වීද? වීදුරුව ටීපෝව මත තබද්දී ඇගේ සිතේ කොණක ජනිත වී නිවී ගිය සිතුවිලි අතර ඒ සැකය ද විය.

සිතන්නට සොයාබලන්නට කාලයක් හෝ හැකියාවක් හෝ නොලද මදාරා පිවිසෙමින් සිටියේ මනසට විසල් සැහැල්ලුවක් ලබා දෙන නින්දත් නොනින්දත් අතර තැනකට ය. ඒ සැහැල්ලු ලෝකයේ සුවය අතරේ ඈත දුරකට තමා පාව යනු ඇයට දැනුණි. ඒ අතරේ රහසින් මෙන් මුමුණන තිසර සූරියබණ්ඩාරෙග් කට හඬද ඇයට ඇසුණි. ඔහු කීවේ කුමක්දැයි සිතන්නට වෙහෙසෙන්නට ඇයට අවශ්‍ය නොවීය. ඇයට ඒ මොහොතේ අවශ්‍ය වූ එකම දෙය මේ සැහැල්ලු ලෝකයට තව තවත් නතුවීම පමණකි. මේ සුව සිහිනය කිසිදා නොවිඳි තරම් සුවදායක එකකි.

කොයි තරම් වේලාවක් තමා ඒ සුව සිහිනයේ සිටින්නට ඇද්දැයි මදාරාට නිනච්චක් නොවී ය. ඇය අවදි වූයේ යම්කිසිවකු නින්දෙන් ගොරවන ශබ්දයට ය. මතින් බර වූ හිස ඔසවා අවට බලන්නට ඇය උත්සාහ ගත්තා ය.

තමා ඇඳක වැතිර සිටින බවත් තමා අසළින් කිසිවකු අනෙක් පසට හැරී නිදා සිටින බවත් මොහොතකින් ඇයට වැටහිණි. තමාගේ ගවොම නිදා සිටින මිනිසාගේ ඇඟට යටවී තිබෙනු ද ඇය දුටුවා ය. ඈ හැකි වැර යොදා දෑතින්ම ඇඳුම ඇද්දා ය. නිදා සිටි පුද්ගලයා ඇහැරුණේ ඒ කලබලයට ය. දෑතින් ගත් ගවොම ඇඳගන්නට පවා නිනච්චක් නැතිව මදාරා බිත්තිය මුල්ලට ගුලි වූවා ය. ඇඳ මත වැතිර සිටි ආචාර්ය තිස්ස කුසල්ගොඩ ගේ නිදිබර දෑසේ බැල්ම ඇය දෙස ම එල්ලව තිබුණි. වයෝවෘධ මිනිසාගේ ඒ බැල්ම දරා ගත නොහැකිව මදාරා ගවොමෙන් සිය මුහුණ වසා ගත්තා ය.

අවුල්ව ගිය සුදු කෙසින් සිය මුඩු හිස වසා ගන්නට උත්සාහ ගනිමින් කුසල්ගොඩ බියපත් මුවැත්තියක සේ වෙවුළමින් සිටි තරුණිය දෙස බැලුවේ ය.

"මදාරා... කලබල වෙන්න එපා" ඒ ගැඹුරු හඬ සිය සවනට යවුලකින් අනින්නාක් මෙන් මදාරාට දැනුණි.

මදාරා බිත්තිය මුල්ලට ම ගුලි වූවා ය.

මේ සිදුව ඇත්තේ කුමක්දැයි වටහා ගන්නට තරම් නිරවුල් මානසිකත්වයකින් තමා පසුනොවන බව ඇයටම වැටහුණි. ප්‍රකෘතියත් මායාවත් අතර දෝලනය වෙමින් ඇති සිතින් සියල්ල එකලස් කර නිරවුල් සිත්තමක් නිමවා ගන්නට ඇය උත්සාහ කළා ය. සූරියබණ්ඩාර විසින් තමා මේ තරම් පහත් තත්වයකට ඇද දමනු ලැබ ඇතැයි කෙසේ නම් අදහා ගන්නද?

විසල් පිපාසයකින් උගුර වේලී කෙළ ගිලගන්නටවත් නොහැකි සෙයක් ඇයට දැනුණි. ඇඳ හිස අද්දර කනප්පුව මත වීදුරුවක ඇත්තේ දොඩම් යුෂ පානය නොවේද? ඈ දෙවතාවක් නොසිතාම වීදුරුව අතට ගත්තාය. එක හුස්මට වීදුරුව ම බීවා ය. දෑස් පියවී යමින් තිබියදී ආචාර්ය කුසල්ගොඩ ගේ ගිණි පුළිඟුවන් දෑස් තමා දෙස ම එල්ලවී තිබෙනු ඇය දුටුවා ය.

මදාරා යළිත් වතාවක් ඉක්මණින්ම සැහැල්ලු නින්දට වැටුණා ය.

00000000

"තිසර සූරියබණ්ඩාර ඒ වගේ පාහරයෙක් කියල මං හීනෙකින් වත් හිතුවෙ නෑ සර්.." මදාරා සුසුමක් හෙළණු ඇයට පිටුපා සිටගෙන සිටි විදුලට ඇසුණි. හැරී ඇගේ මුහුණ දෙස බලන්නට නොහැකි බවක් ඔහුට දැනුණි. ඇය හඬමින් සිටින බව ඔහුට දැනුණි.

"කොයි තරම් කාලයක් මං ඒ අපායෙ හිටියද කියන්න අදවත් මං දන්නෙ නෑ සර්.." මදාරා මිමිණුවා ය. "..දවසක්ද දෙකක්ද තුනක්ද කියන්නවත් මං දැනං හිටියෙ නෑ.. එක වෙලාවක සිහිය එනකොට උන් දෙන්නම හිටියෙ නැහැ.. මං අමාරුවෙන් බාත්රූම් එකට ගිහින් වරුවක් විතර නෑවා.. පාරට ආවත් යන්නෙ කොහෙද කියලා හිතා ගන්න බැරුව මං හිටගෙන හිටියා.. මොක්දෝ නොසන්සුන් කමකින් හිත පිරිලා තිබුණා.. අර මත්වෙන බීම ආයෙම බොන්න ඕනෙය කියන හැඟීම මටම පාලනය කරගන්න බැරි තරමට මට දැනුණා.. මං අසංග හමුවෙන්න යන්න තීරණය කළා.."

"ඇයි..?" විදුල ප්‍රථම වතාවට හැරී ඇගේ මුහුණ බැලුවේ ය. ඇය ඔහුගේ බැල්ම මගහැර ඉවත බලා ගත්තා ය. විදුලි පංකාවේ දැඩි සුළඟින් විසිරෙන අකීකරු කෙස් කැරලි සකස් කර ගන්නට හෝ නොවෙහෙසුණ මදාරා දබරැඟිල්ලෙන් මේසය මත ඉරි අඳිමින් මොහොතක් ගත කළා ය.

"මං හිටියෙ පිස්සුවෙන් වගේ.. වචන වලින් කියන්න බැරි මටම තේරුම් ගන්න බැරි මොකක්දෝ අසහනයක් මගේ හිතේ තිබුණා.. මට මාවම පාලනය කරගන්න බැරි බවක් දැනුණා.. අසංග ගෙන් සහනයක් ලැබේවි කියලා මං හිතුවා.. අසංග මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා හිටිය බව මං දැනගෙන හිටියා.. මං එයාගෙ කාමරේට යනකොටත් එයා හිටියෙ අඩ සිහියෙන්.. එයා මගෙන් ප්‍රශ්න අහන්න ආවෙ නැහැ.. එදා මං පළවෙනි වතාවට මගේ උවමනාවටම ඩ්‍රග්ස් ගත්තා.." මදාරා කතාව නවතා විදුල දෙස බැලුවා ය. "...එතනින්